# බෞද්ධ ඥානයෙහි සීමා සංකල්පයෙන් මතු වන සදාචාරාත්මක අගය පිළිබඳ විමසීමක්

ආර්. පී.ඩී. එම්. රාජපක්ෂ[1]

දර්ශනය (Philosophy) යන විෂය ක්ෂේත්‍රයේ එන උප විෂයක් වන ඥානවිභාගය (Epistemology/ Theory of knowledge) නම් කොටසෙහිදී සාකච්ඡා වන ප්‍රධාන කරුණක් වන්නේ ඥානයෙහි සීමා (Limits of knowledge) යන්න යි. ඥානයට සීමා පැනවෙන්නේ යම්කිසි බාධාවක් නිසා ය. ප්‍රායෝගික සීමා, නෛසර්ගික සීමා, තාර්කික සීමා යනාදී වශයෙන් ඥානයට සීමා පනවන එබඳු බාධක කිහිපයක් හඳුනා ගත හැක. ඥානයේ සීමා පැනවීම පිළිබඳ භාරතීය සංශයවාදීන් වූ අමරාවික්ඛේපවාදීන් ඉහත කී ත්‍රිවිධ සීමා පමණක් නොව, සදාචාරාත්මක සීමා ද අවධාරණය කොට ඇති අතර එහි වඩාත් ම ප්‍රායෝගික හා උච්ඡතම අවස්ථාව සනිටුවහන් වන්නේ බුදුදහමෙනි. ඥානයෙහි ප්‍රායෝගික සීමා යටතේ භෞතික ලෝකය නැතහොත් ආනුභවික විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැන ගැනීමට ඇති නොහැකියාවන් අදහස් කෙරේ. නෛසර්ගික සීමා යටතේ අදහස් කෙරෙන්නේ ඥානය ලබා ගැනීම පිළිබඳ මානවයා තුළ පවත්නා සහජ බාධාවන් ය. ඇතැම්විට මානසික සාධක ද මෙම මානව ඥානය පිළිබඳ ධාරිතාවයට බලපායි. තාර්කික සීමා යටතේ අදහස් කරන්නේ භාෂාවේ පවත්නා බාධාවන් ඥානයේ සීමා සඳහා කොතෙක් දුරට බලපාන්නේද? යන්න ගවේෂණය කිරීම යි. සදාචාරාත්මක සීමා ලෙස ගැනෙන සුවිශේෂී කරුණ තුළින් භාරතීයයන්, විශේෂයෙන් බුදුදහම ඥානයෙහි සීමා ආධ්‍යාත්මික පාරිශුද්ධිය සඳහා පාදක කර ගත් අයුරු පෙනේ.

බුදුරදුන් තමන් වහන්සේට පූර්වගාමී වූ හා සමකාලීන වූ චින්තකයන්ගේ ඇතැම් ඥාන මාර්ග පිළිබඳ දැක්වූ ආකල්පය සතුටුදායක නොවන බව පෙනේ. ලෝකය හා සත්ත්වයා පිළිබඳ යථාර්ථවාදී ඥානය ලබා ගැනීම ඉන්ද්‍රියානුබද්ධ මනසින් සිදුකළ හැකි බව පිළිගත් ඇතැමුන් අනුභූතිවාදය භාවිත කොට තිබුණේ බුද්ධ කාලයටත් පෙරාතුව යි. යෝගී ප්‍රත්‍යක්ෂය හුදෙක් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයයෙන් නොනවතී. බුදුසමය අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය තුළින් පැමිණිය හැකි ඉහළ ම තලය වන සියලු ආසවක්ෂය කිරීමේ ඥානය (ආසවක්ඛය ඥානය) උපදවා ගන්නා ආකාරය පෙන්වාදී ඇත. ඒ අනුව මෙම සම්බන්ධව බුදුරදුන් විසින් දේශනා කරන ලද්දේ දුකත් එහි නිරෝධයත් පමණි.

ධර්ම දේශනා කිරීමේදී බුදුරදුන් ඇතැම් ප්‍රශ්න පිළිතුරු නොදී පසෙකින් තැබූ බව සඳහන් වන අතර එලෙස බුදුරදුන් පිළිතුරු ලබා නොදුන් ප්‍රශ්නවල ස්වරූපය සොයා බලනවිට පෙනී යන්නේ එබඳු ප්‍රශ්න තාර්කික හා දාර්ශනික ගැටලුවලට දොරගුළු විවෘත කරන විමුක්ති සාධනයෙහිලා අනවශ්‍ය පාර්ශ්වය නියෝජනය කරන ආකාරය යි. මේ තුළින් එක්තරා ආකාරයක ඥානය සම්බන්ධ සීමාවක් පැනවෙන බවත් එය වනාහි පුද්ගල විමුක්තිය ඇගයෙන සදාචාරාත්මක පදනමක් අදහස් වන බවත් ගම්‍ය වේ. ඥානයෙහි සීමාවෙන් ඔබ්බෙහි පවත්නා දේ පිළිබඳ බුදුසමය නිශ්චිත නිගමනයකට පැමිණීම අනුමත නොකරන අතර ම එලෙස ඒ පිළිබඳ දිගින් දිගට

1 සහාය කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයන ඒකකය, කොළඹ විශ්වවිද්‍යාලය
dilshanmanojrajapaksha@gmail.com

ම සිදුකරන නිශ්ඵල උත්සාහ ප්‍රතික්ෂේප කරයි. බුදුසමය ඥානය සම්බන්ධයෙන් පවත්නා ප්‍රායෝගික, නෛසර්ගික, භාෂා හෙවත් තාර්කික සීමා පනවන්නේ නිශ්චිත අරමුණකිනි. එනම් නිර්වාණය යි.

බුදුන් වහන්සේ දේශනා කළ ධර්ම මාර්ගය පිළිපැදීම කළ යුත්තේ මූලික වශයෙන් ම අවබෝධයකින් අනතුරුව ය. දැනීමකින් තොරව බෞද්ධ ප්‍රතිපදා අනුගමනය කළ නොහැකි බව එහි අදහස වේ. ධර්මය අසා, මතක තබාගෙන, අර්ථ විමසීමේ ක්‍රියාදාමය හෙවත් ධර්ම අධ්‍යාපනය ධර්මාවබෝධයෙන් අවසාන කිරීම මෙමගින් අදහස් වේ. ධර්මය හැදෑරීමෙන් ලැබෙන ධර්ම ඥානය ඉතා වැදගත් වුවත්, එය හුදෙක් මාධ්‍යයක් හෙවත් කිසියම් අරමුණක්, ඉටුකර ගැනීමේ ක්‍රමෝපායක් ලෙස පමණක් වැදගත් වීම අපගේ සැලකිල්ලට ලක් විය යුතු ය. මේ තුළින් ඇගයෙන ඥානයෙහි සීමා පිළිබඳ සංකල්පය සදාචාරාත්මක සීමාවක් වටා කේන්ද්‍ර වී ඇති ආකාරයත් ඒ තුළින් පුද්ගල විමුක්තිය අවධාරණය වන ආකාරයත් පැහැදිලි වේ.

**ප්‍රමුඛ පද:** ඥානයෙහි සීමා, බුදුදහම, අමරාවික්ඛේපවාදය, ඥානවිභාගය, සදාචාරය